(නවවැනි පාර්ලිමේන්තුව -  තෙවැනි සභාවාරය)

අංක 25. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ඔක්තෝබර් 20 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු  නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු  පාඨලී චම්පික රණවක මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  කුමාරසිරි රත්නායක මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  චමල් රාජපක්ෂ මහතා

ගරු  (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු  නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු  මහින්ද රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු  එම්. රාමේෂ්වරන් මහතා

ගරු  වරුණ ලියනගේ මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  චමින්ද විජේසිරි මහතා

ගරු  නීතිඥ මධුර විතානගේ මහතා

ගරු  හේෂා විතානගේ මහතා

ගරු  (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු  නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු  විමල් වීරවංශ මහතා

ගරු  ඩී. වීරසිංහ මහතා

ගරු  වීරසුමන වීරසිංහ මහතා

ගරු  (ආචාර්ය) සරත් වීරසේකර මහතා

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1.**කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

“ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද ‘පුනරුත්ථාපන කාර්යාංශය’ නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පතෙහි සමස්ත විධිවිධාන පිළිබඳව සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය පහත සඳහන් තීරණය ලබා දී තිබේ:—

මෙම පනත්කෙටුම්පත සමස්තයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව සමග අනනුකූල වන අතර ඒ අනුව එය පනවනු ලැබිය හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 (2) ව්‍යවස්ථාව මඟින් නියම කරනු ලැබ ඇති පරිදි විශේෂ බහුතරය සහිතව පමණකි.

කෙසේ වුවද,

(i) ‘පෙර-සටන්කරුවන්’, ප්‍රචණ්ඩ අන්තවාදී කණ්ඩායම්’ හා ‘අන් කවර හෝ තැනැත්තන් කණ්ඩායමක්’ පිළිබඳව කර ඇති සෑම සඳහනක්ම ඉවත් කළ හොත්; සහ

(ii) මෙම පනත් කෙටුම්පතෙහි බලපෑම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට හා වෙනත් එවැනි තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා පමණක් සීමා වුවහොත් මෙම අනනුකූලතාව ඉවත් වනු ඇත.

පනත් කෙටුම්පතෙහි 3, 4(අ), 4(ආ), 6(ආ), 23, 24, 25 (2), 27, 28 (1), 34, 35 සහ 37 වගන්ති [‘පුනරුත්ථාපනය’ යන්නෙහි නිර්වචනය] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව සමඟ අනනුකූල වන අතර ඒ අනුව ඒවා පනවනු ලැබිය හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 (2) ව්‍යවස්ථාව මඟින් නියම කරනු ලැබ ඇති පරිදි විශේෂ බහුතරය සහිතව පමණකි.

කෙසේවෙතත්, එකී වගන්ති පහත පරිදි සංශෝධනය කරන්නේ නම්, එකී අනනුකූලතාවයන් අවසන් වනු ඇත:—

<u>3 වන වගන්තිය</u> - කාර්යාංශයේ පරමාර්ථය වනුයේ මත්ද්‍රව්‍ය මත යැපෙන පුද්ගලයින් හෝ පුනරුත්ථාපනය අවශ්‍ය පුද්ගලයෙකු ලෙස නීතියෙන් හඳුනාගත හැකි වෙනත් ඕනෑම පුද්ගලයකු පුනරුත්ථාපනය කිරීම වන අතර ඊට සමාජ-ආර්ථික ප්‍රමිතීන් වර්ධනය කිරීම තුළින් ඵලදායී ලෙස නැවත සමාජගත කිරීම සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම සඳහා ප්‍රතිකාර සහ විවිධ චිකිත්සාවන් අනුගමනය කිරීම ද ඇතුළත් විය හැකිය.

<u>4(අ) වගන්තිය</u> - ‘2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පනතට අනුව ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ තැනැත්තන් හෝ එවැනි නීතියක් මඟින් ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන ඕනෑම පුද්ගලයෙකුට ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම’.

<u>4(ආ) වගන්තිය</u> -‘අදාළ නීතියකට අනුව, පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ එවැනි නීතියක් මඟින් ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන ඕනෑම පුද්ගලයෙකුට පුනරුත්ථාපනය ලබා දීම;’

<u>4 වන වගන්තිය</u> - පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීම මඟින් (ඉ) ‘මානව හිමිකම් පිළිබඳ මූලික සම්මතයන් සම්බන්ධයෙන් පුනරුත්ථාපනය, ප්‍රතිකාර කිරීම සහ පසු රැකවරණය සඳහා වන වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම.’

<u>6(ආ) වන වගන්තිය</u> - ‘පහත සඳහන් සාමාජිකයින් පස් දෙනා (මෙහි මින් මතු’ පත් කළ සාමාජිකයින්" වශයෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය:—

(i) පුනරුත්ථාපන ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් දෙදෙනෙකු;

(ii) සමාජ ඒකාබද්ධකරණ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් දෙදෙනෙකු; සහ

(iii) නීතිය හා සාමය ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත එක් පුද්ගලයෙකු.’

<u>23 වන වගන්තිය</u> - ‘හිටපු සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම්වල සාමාජිකයින්, ප්‍රචණ්ඩකාරී අන්තවාදී තැනැත්තෙක් සහ වෙන යම් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක්’ යන වචන ඉවත් කිරීම මඟින්, සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ තැනැත්තන් සහ නීතිය විසින් හඳුනාගනු ලබන හා පුනරුත්ථාපනය සඳහා නීතිය විසින් විධිවිධාන සලසනු ලැබ ඇති එවැනි තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම පමණක් කාර්යාංශය විසින් කළමනාකරණය

කරනු ලබන මධ්‍යස්ථානයක දී සිදු කරනු ලබන්නේය යන ස්ථාවරය දැක්වෙන පරිදි මෙම වගන්තිය සුදුසු ලෙස සංශෝධනය කිරීම මඟින්.

23 වන වගන්තිය - පහත සඳහන් විධිවිධානවලට යටත්ව, නීතිපතිවරයා විසින් යෝජනා කරන ලද පරිදි සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි 36 සහ 37 පිටුවල සඳහන් කරන ලද පරිදි ,23 (2) සිට 23( 7) ලෙස අංක කරන ලද නව උප වගන්ති ඇතුළත් කිරීම මඟින්:—

(i) 23( 3) (අ) වගන්තිය - මෙම 'ඡේදය අවසානයෙහි' සහ මධ්‍යස්ථානය තුළ පවත්වාගෙන යනු ලබන වාර්තා සහ ලොග් සටහන් පොත් පරීක්ෂා කරනු ලැබිය හැකිය' යන වචන ඇතුලත් කිරීම මඟින්

(ii) 23( 5) වගන්තිය - මෙම වගන්තිය අවසානයෙහි 'එකී තැනත්තා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා වහාම රජයේ රෝහලකට ඇතුළත් කළ යුතු බවට සහ රජයේ වෛද්‍ය නිලධාරියා විසින් අනාවරණය කරන ලද කරුණු එකී මධ්‍යස්ථානය භාර නිලධාරියා විසින් එකී තැනැත්තා පුනරුත්ථාපනය කිරීම සඳහා වූ නියෝගය ලබා දෙන ලද අධිකරණය වෙත වහාම වාර්තා කළ යුතු බවට නියෝගයක් ඇතුළත්ව' යන වචන එකතු කිරීම මඟින්

24 වගන්තිය - 'හෝ කිසියම් අනවසර භාණ්ඩයක්' යන වචනවලින් අනතුරුව' නියම කරනු ලැබිය හැකි පරිදි' යන වචන ඇතුළත් කිරීම මඟින්

25( 2) වගන්තිය - පහත සඳහන් විධිවිධාන වලට යටත්ව, නීතිපතිවරයා විසින් යෝජනා කරන ලද පරිදි සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි 40 වන පිටුවෙහි සඳහන් ව ඇති පරිදි 25 (2 )වගන්තිය ඇතුළත් කිරීම මඟින්

(i) 25 (2) (අ) වගන්තිය අවසානයේදී, සහ වරහන් තුළ ඇති වචනවලට පසු 25 (2) වගන්තියේ අතුරු විධානය තුළ 'එවැනි තැනැත්තකු නියෝජනය කරනු ලබන නීතිඥයකු හෝ' යන වචන එකතු කිරීම;

(ii) 25(2)(ආ) වගන්තිය අවසානයේ ඇති 'පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් තුළ' යන වචන ඉවත් කිරීම.

27 වන වගන්තිය - නීතිපතිවරයා විසින් යෝජනා කොට ඇති පරිදි සහ තීන්දුවේ 44 වන පිටුවේ දක්වා ඇති 'නීති විරෝධී ලෙස' සහ 'නීත්‍යානුකූල' යන වචන ඇතුලත් කිරීම මඟින්.

28(1) වගන්තිය - නීතිපතිවරයා විසින් යෝජනා කොට ඇති පරිදි සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි 45 වන පිටුවේ දක්වා ඇති පරිදි 'කවර හෝ බලයලත් හමුදා සාමාජිකයකු' යන වචන ඉවත් කිරීමෙන් සහ 'වහාම' යන වචන ඇතුළත් කිරීමෙන්.

28 වන වගන්තිය - නීතිපතිවරයා විසින් යෝජනා කොට ඇති පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් '28(i) සහ(2) වගන්තිය යටතේ ඇති කවර හෝ බලතලයක් ක්‍රියාත්මක කිරීම එම මධ්‍යස්ථානය පිහිටා ඇති අධිකරණ කොට්ඨාසය තුල සිටින මහේස්ත්‍රාත්වරයා වෙත වහාම දැනුම් දීම පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයාගේ හෝ ඔහු විසින් නිසි පරිදි බලය පවරන ලද පුද්ගලයකුගේ වගකීම විය යුතුය.'

34 වැනි වගන්තිය - 34(1) වැනි වගන්තියේ අවසානයට පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්-

'එසේ වුවද, මෙම පනතට අනුකූලව නියෝග සාදනු ලැබීම අවශ්‍ය වන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් නීති සම්පාදනයට සභාවට බලය නොතිබිය යුත්තේය.'

35 වැනි වගන්තිය - ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙහි 29 වැනි සහ 30 වැනි පිටුවල සඳහන්ව ඇති ආකාරයට සංශෝධනය කරනු ලැබිය යුතුය.

37 වැනි වගන්තිය - ''පුනරුත්ථාපනය'' යන්නෙන් මෙම පනත යටතේ සාදන ලද නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු පුනරුත්ථාපනය, ප්‍රතිකාර, පසු රැකවරණය සහ සහාය වෙනුවෙන් වන ක්‍රියාපටිපාටි සහ වැඩසටහන් අදහස් වේ.'

පනත් කෙටුම්පතෙහි 17 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එසේ හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවට අනුව අවශ්‍ය වන පරිදි විශේෂ බහුතරයකින් පමණක් බලාත්මක කළ හැකි වන්නේය.

පනත් කෙටුම්පතෙහි 25(1) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ ව්‍යවස්ථාවට අනනුකූල වන අතර එසේ හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවට අනුව අවශ්‍ය වන පරිදි විශේෂ බහුතරයකින් පමණක් බලාත්මක කළ හැකි වන්නේය.

කෙසේවෙතත්, එකී වගන්තිය අවසානයට 'හෝ තොරතුරු දැනගැනීමේ පනතෙහි විධිවිධාන' යන වචන එක් කිරීම මඟින් 25(1) වගන්තිය සංශෝධනය කරනු ලැබුවහොත් එකී අනනුකූලභාවය අවසන් වන්නේය.

ඉහත සඳහන් කළ අනනුකූලතාව අවසන් වීමට නම්:

පනත් කෙටුම්පතේ 26 සහ 28(2) වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව හා අනනුකූල වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවට දක්වා ඇති පරිදි එය විශේෂ බහුතරයකින් බලාත්මක කළ යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වැනි ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි ජනමත විචාරණයකදී ජනතාව විසින් ද අනුමත කළ යුතුය.

(i) 26 වැනි වගන්තියේ සඳහන් 'යුක්තිසහගත හේතුවක් නොමැතිව' යන වදන් ඉවත් කළ යුතු ය;

(ii) 28(2) වගන්තියේ සඳහන් 'එවැනි සියලු ක්‍රියාමාර්ග ඇතුළුව' යන වදන් ඉවත් කළ යුතුය.

පනත් කෙටුම්පතේ 29 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 3 සහ 4 වැනි ව්‍යවස්ථා හා අනනුකූල වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි එය විශේෂ බහුතරයකින් බලාත්මක කළ යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වැනි ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි ජනමත විචාරණයකදී ජනතාව විසින් ද අනුමත කළ යුතුය.

ඉහත සඳහන් කළ අනනුකූලතාව අවසන් වීමට නම් 'හෝ ඕනෑම නියමයක්' යන වචන ඉවත් කිරීම මඟින් 29 වැනි වගන්තිය සංශෝධනය කළ යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම නියමය සභාවේ අද දිනට අදාළ කටයුතු සම්බන්ධයෙන් පළ කෙරෙන නිල වාර්තාවේ මුද්‍රණය කරන මෙන් මම නියෝග කරමි.''

**2.ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXIV කොටස, සිව්වැනි කාණ්ඩයේ XIX කොටස, පස්වැනි කාණ්ඩයේ IX කොටස සහ හයවැනි කාණ්ඩයේ XXI, XXII හා XXIII කොටස්; සහ

(ii) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV, V, VI, VII, VIII, IX හා X කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ VI, VII හා VIII කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3.වරප්‍රසාද:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවී ඇති බවට 2022 ඔක්තෝබර් 19 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4.විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.31 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 1.27 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 3.07 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

"විවාදය දැන් කල් තැබිය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එතැන් සිට විවාදය 2022 ඔක්තෝබර් 21 සිකුරාදා පවත්වනු ලැබේ.

**5. කල් තැබීම (වතුකර ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී.දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 4.59 ට ගරු නීතිඥ ප්‍රේමනාත් සී.දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා

පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 ඔක්තෝබර් 21 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.